



ඩෙරික් ඊ. ශොක්මන් විසිනි

## ශ්‍රී ලංකාවේ අභයභූමි සම්බන්ධව විවිධ ලියුම්කරුවන් විසින් පල කෙරෙන ලිපිපෙලේ පළමු ලිපියයි මේ

විල්පත්තුව වැනි අභය භූමියකට යාමේදී ඔබගේ තනි අභිප්‍රාය විය යුත්තේ මනහර සතුන් හා පක්ෂීන් රාශියක් දැක බලා ගැනීම පමණක් නොවිය යුතුය. එවැන්නකට නම් ඔබට දෙහිවල සත්ව උද්‍යානයට යාම වුවද සෑහෙන්නේය. නමුත් අභය භූමියක් තුලදී ඔබගේ සිත්සතන් යොමු කළ යුත්තේ නිදැල්ලේ හැසිරෙන සතුන් හා ස්වභාවික වෘක්ෂලතාදිය අතර ඇති සෘජු දර්යමත් අන්‍යොන්‍ය සම්බන්ධතාවය කෙරෙහි වේ.

වන සතුන් ඔබ දන්නා පරිදි, ආහාර සොයා වනයේ ඔබ මොබ හැසිරීම සාමාන්‍ය දෙයකි. කුළු මී හරක්, මුවන්, වැනි සතුන් තණබිම් කරා ඇදෙන අතර, ඒ පසුපස ගොදුරු සොයමින් දිවියන් මාන බලති. ඉතිරි වී ඇති යමක් ගොදුරු කර ගන්නා අදහසින් ඔවුන් පිටුපස ඇදෙන්නෝ වල් ඌරන්, නරියන් වැනි සතුන්වේ.

මේ අන්දමින් වන සතුන්ගේ පරිසංක්‍රමණය දිගටම පැවතීමට නම් තැනින් තැන පැතිරී ගිය කුඩා ජලාශයන්ද තිබිය යුතුවේ. වැලි සහිත ඉවුරු වලින් යුත් විල් නමින් හඳුන්වන, විල්පත්තුවෙහි පිහිටා ඇති මෙම ජලාශයන් රාශිය නිසා මෙම අභය භූමියට එම නම ලැබී ඇත. ඇත්තෙන්

ම මෙම අභය භූමිය තුළදී ඔබගේ නෙත් මුලින් ඇදී යනුයේ අවට දිස්වන කැලෑ රොදට වඩා එය තුළවූ මෙවන් විල් විසි ගත කෙරෙහි වේ.



කුතුහලයෙන් පිරි හැඟීම් වලින් යුතුව මෙවැනි විලක් වෙත යන ඔබට බොහෝවිට ඒ තරම් දෙයක් දක්නට නොලැබෙනු ඇත. තිලාපියා වැනි මසකු ගොදුරු කර ගැනීමට මාන බලන කොකුන් කීප දෙනෙකු හැර වෙනත් සතෙකු පෙනෙන තෙක් මානයේ නොසිටින්නට පුළුවන. කෙසේ නමුත් මේ හැර තවත් විල් රාශියක් ඇති හෙයින් යටත් පිරිසෙයින් පක්ෂීන් වර්ග කිහිපයක් හෝ වැල්ලේවූ අලින්ගේ අඩිපාරවල් කීපයක් දැක ගැනීමේ ආශාවෙන් ඔබට තවදුරටත් යාමට සිත් දේ.

මේ අන්දමින් සමහරවිට පැය කිහිපයක් ගතවීමෙන්, ඔබ බලාපොරොත්තු කඩවූ දඩයක්කරුවකු මෙන් දෙම්නසට පත්විය හැක. නමුත් අනෙක් අතට මෙවැනි තැනකට සතුන් සංක්‍රමණය වේ නම්, ඔවුන් කිහිප වර්ගයක් දැක ගැනීමට අවස්ථාව ඔබට සැලසෙනු ඇත. ආහාර ගැනීමට හා දිය බීමට එක්වන මෙම සතුන් දක්නා ඔබ සිහිත්තෙකු මෙන් සොම්නසින් පිරී ගොස්, එකිනෙකාගේ කනට කොඳුරමින්, ඉබේම වාගේ ළඟ ඇති කැමරා සහ දුරබලන කන්නාඩි ඔවුන් වෙත මාන කිරීමට සැරසෙනු ඇත. සමහර විට ඒ දෙස දෙතුන් වරක් බලන තෙක් තණ පඳුරු අතරේ සිටින තිත් මුවන් ඔබට දිස් නොවිය හැක.

ඔවුන්ගෙන් සමහරක් ඔබ වෙත තියුණු ලෙස නෙත් යොමුකර නැවත සුපුරුදු ලෙස තණ බුදිනු ඇත. ඇත්තෙන්ම විල්පත්තුවෙහි සතුන් මිනිසුන් කෙරෙහි නොදක්වන චකිතය ඔබගේ පුදුමයට හේතුවනු නිසැකය. කෙසේ වෙතත් වන දිවියන්ගේ ගෙරවිලි හඬටත්, වලි කුකුලන්ගේ අදෝනා හඬටත් ඔවුන් නිගැස්සනුයේ සුළු පවු ලෙස නොවේ. සැනෙකින්ම සොහොන් බිමක මෙන් ඇති වන නිසලතාවයත්, සමග මුවරංචුව ගල් පිළිමයන් මෙන් කන්යොමා බලා සිටිනු ඇත. විනාඩියක් පමණ නිසොල්මනේ සිටින ඔවුන් නැවත බියදුරු කරගත්තාක් මෙන් ඒ මේ අත හැරෙනු පෙනේ.

දිය කඩිත්ත කරා දිව යන මුවන්, එහිවූ බොර වතුර බී ටික වේලාවක් රැඳීමෙන් පසුව දිව යන්නේ කඩිනමින්ය. වනයේ ඔබ මොබින් නිකුත් වන තියුණු හා පහත් හඬ වලට නිසි පරිදි ප්‍රතිචාරය දක්වන මොවුන් හැසිරෙන්නේ ඉතා තීක්ෂණ හා ක්‍රියාකාරී බවකින් යුතුව වේ.

දැඩි නියඟය පවතින කලක නම් ඔබට බොහෝ විට අහිංසක වැලි මුවන් දැකීමට අවස්ථාවක් ලැබෙනු ඇත. තිත් මුවන් මෙන් තණ උලා කෑමට නොඑන මොවුන් පිපාසිතව සිටිනවිට හැර වන ලැහැබෙන් පිටතට එන්නේ ඉතා කලාතුරකිනි. දිය කඩිත්ත වෙත හෙමින් ළඟාවෙන මොවුන් නිතැතින්ම නිගැස්සෙනුයේ බිම හැලෙන



කොලයක් පවා අනතුරක් හඟවන්නේ යයි කියන්නාක් මෙනි.

ගොදුරු සොයා යන දිවියෙකු මෑතක නොසිටින්නට, මෙවැනි දිය කඩිතිවල ඒ තරම් අවදානම් තත්ත්වයක් නොමැත්තේය. ඇත්තෙන්ම දඩයමේ යන දිවියකුගේ දර්ශණයක් තරම් අභිමානවත් දැකුමක් මෙම වනයේ නැති තරම්ය. හිස පහලට නැඹුරු කර ගෙන තීක්ෂණ දැසින් යුතුව දිවියා ඉදිරියට ඇදෙන්නේ වනයේ බලධාරියෙකු ලෙසිනි. වනයේ වෙනත් කිසිම මෘගයෙකු, අලියෙකුගෝ කුළු මීමකු පවා සාමාන්‍යයෙන් ඔහු වෙත නිර්භයව ආක්‍රමණයක් එල්ල නොකරන බව ඔහු දනී. මුළු මහත් වනයම ඔහු කෙරෙහි බියෙන් නොසැලී සිටින්නේ යයි ඔහු විශ්වාස කරයි.




සාමාන්‍යයෙන් වන දිවියාට බොහෝ විට ගොදුරු වන්නේ අහිංසක මුවන්ය. කෙසේ නමුත් විශේෂයෙන් වල් ඌරන් දඩයමේ යෙදෙන දිවියකු මානික්කපොල වසන්නේය. එක් සැන්දෑවක එවැනි දඩයමක් කර ගෙන තම කුසගිනි නිවාගෙන සිටින මෙම මෘගයා දැක ගැනීමේ වාසනාව අපට ලැබුනෝය. දිවියන් තරමක් කුණුවී ගිය මස් ආහාරයට ගැනීමට කැමැත්තෝය. ඇත්තෙන්ම අපට මේ අවස්ථාව සැලසුනේ, එවැනි කුණු මස් ගඳක් කෙරෙහි යොමුවූ අපගේ අවධානය නිසාය. බාගෙට කා හැර දමා තිබූ එම වල් ඌරු කුණ අපට දක්නට ලැබී මොහොතකින්, ඊට ඔබ්බෙහි සුවසේ සැතපී සිටින දඩයක්කරු දිස්විය.

හෙතෙම පරිපූර්ණ දේහයෙන් යුත් කඩවසම් සිවුපාවෙක් විය. නාසයේ සිට වලිගය කෙළවර දක්වා දිග අඩි 7½ ක් පමණ විය. කලාතුරකින් ඇඟ කැසීමට ඒ මේ අත පෙරළෙනා විනා, ඔහු අපෙන් අඩි 20 ක් තරම් ඔබ්බෙන් වැලි බිමෙහි වැතිර සිටියේ නිසොල්මනේය. පෙනුම අඩක් බළලෙකු වැනිය. අනෙක් අඩ, බළලකුගේ පිළිරුවක් වැනිය. කෙසේ වුවද ගෙදර සිටින බළලාගේ හැඩහුරුකම් සියල්ලක්ම දක්වන වනගත සිවුපාවකු එක්වර ඔබට හැඳින ගැනීමට අපහසුවක් නොවනු ඇත. නිදිමත දැසින් යුතුව හිටි හැටියේම හිස ඔසවා, උරහිසට ඔබ්බෙන් බැලීමත්, වලිගය ඒ මේ අත ඇඹරීමත්, නැවත කිසිවක් ගණන් නොගත්තාසේ සිටීමත්, හැම අතින්ම ගෙදර සිටින බළලාට සමානය.

කෙසේ වුවත් වන දිවියන් පිළිබඳ නොයෙකුත් කතා එමටය. මෙහි සෑම කෙනෙකුටම ඔවුන් පිළිබඳ කිවහැකි කිසියම් කතාන්තරයක් ඇත. දිවියා වනයේ රජා වුවත්, එය සැමවිටම සත්‍ය නොවන බව හුවා දක්වන කතාන්තර දෙකක්, වන සත්වාරක්ෂක දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ පර්සි ද අල්විස් මහතාගෙන් මෙහිදී අපට දැනගන්නට ලැබිණ.

මෙම අභය භූමිය තුලවූ එක් සංචාරක බංගලාවක් ගොඩ නගන අවදියක දිනක් එහි වැඩ කරන අය ඊට යාර සියයක් පමණ ඈතින්වූ මහත් කාලගෝට්ටියකින් තිගැස්සුනාහ. ඔවුන්ට ඇසුනේ රුදුරු වන දිවියකුගේ බියකරු ගෙරවිලි හඬත්, ලේ පෙරෙන වල් ඌරකුගේ කෑගැසීම් හඬත්ය. මෙම ගෙරවිලි සහ කෑගැසීම් හඬ පැයක් පමණ කල් පැවති, මුළු වනය පුරා දැඩි නිහඬතාවය පැතිරිණි. ඒ දෙසට දුව ගිය වැඩ කරන පිරිසට හමුවූයේ, ලේවලින් නැහැවුණු වල් ඌරකුගේ මළකුණත්, ඒ අසලින් ඉරා සීසී කඩ කර තිබූ දිවියකුගේ සිරුරකුත්ය. ඔවුන් දෙදෙනාම මැරී වැටෙන තුරු සටන් වැදී ඇත.

තවත් දිනක සවස් යාමයේ කුඹුක් විල්පුවෙහි දිය කඩිත්තකට දිය බීමට පැමිණි කුළුමී රැලක සිටි කුළු මී පැටවකු, ඒ අසල සිටි දිවියකුගේ උකුසු ඇසට ලක්වී ඇත. කුරුමානම් අල්ලමින්, බඩගාමින් ගොදුරු වෙතට ඇදුනු දිවියා, සෑහෙන තරම් ඊට ළංවූ පසු



විදුලි වේගයෙන් ඒ වෙත පැන කුළු මී පැටවාගේ ගෙලෙන් ඩැහැගෙන වන රොද වෙත ඇදෙන්නට විය. කලබලයට පත්වූ මී රැල සී සී කඩ දුවන්නට වූ නමුදු, තම පැටවාට වූ හදිය ගැන තැතිගත් මව, කෙසේ හෝ තම දරුවා බේරා ගැනීමේ බලවත් අටියෙන් දිවියා වෙත පැන්නාය. කුළු මී දෙනගේ දර දඬු අං කීප වාරයක් දිවියා වෙත එල්ල විය. මිනිත්තු කිහිපයකට පසුව, පලාගිය රැලෙන් මී ගවයන් කිහිප දෙනෙකුද, මේ පොදු සතුරා සමග සටන් කරන මී දෙනගේ ආධාරයට නැවත එක්විය. මේ අතරතුර අවස්ථාව ලත් පැටවා දනිපනිග මින් දිවියාගෙන් ගැලවී මවට එක්වූයේ කුමකින් කුමක් වේ දැයි නොදැනගෙනය.

මෙවැනි සිත් සසල කරවන අවස්ථාවක් දැක බලා ගැනීමට බොහෝවිට ඔබ වාසනාවන්ත නොවනු ඇත. කෙසේ වෙතත් මෙම අභය භූමිය තුල ජීවත්වන දිවියන් 70 ක් පමණ එනම්, එක විල්ලුවක් ආශ්‍රිතව සිටින දිවියන් දෙතුන් දෙනාගෙන් එකෙක්විත්, වනයේ සැරිසරන ඔබට හමු නොවීමට ඉඩක් නොමැත. බියකරු, එනමුත් සිත්කළු මෙම වන මෘගයා සමහරවිට, ඉවක් බවකින් තොරව වන රොද තුල ඇවිදිනු ඔබට හමුවිය හැක. සමහරවිට උන් එකකු වනයේ කෙලවර බිමක, ගාත් දිගා කරගෙන වැතිරී සිටිනු දිස්විය හැක. කෙසේ වුවත් ලෝකයේ කිසිම තැනක් ඔවුනට මේ තරම් සුව පහසු නොදෙනු ඇත.